# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2492/28 - 2026 ජුනි මස 10 වැනි බදාදා - 2026.06.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
ශ්‍රී ලංකා රජය

**2026.05.05**

ශ්‍රී ලංකාවේ ජල සම්පතෙහි තිරසර පැවැත්ම තහවුරු කිරීමට අභියෝගාත්මක වන ගැටළු, නිශ්චිත ලෙස හඳුනාගෙන පිළියම් යෙදීම සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් 2026.05.05 දින සිට බලාත්මක වන පරිදි ක්‍රියාත්මක වන ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2025 ජූලි මස 02 දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/25/1065/802/017 ප්‍රකාරව, දැනට බලාත්මක ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය සමාලෝචනය කර අවශ්‍ය සංශෝධනයන් හඳුන්වා දෙමින් නව ජාතික ජල සම්පත් ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අනුමැතිය හිමි වූ අතර එම සංශෝධිත ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය සඳහා 2026.05.05 දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/26/0792/808/036 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් කැබිනට් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1A - G 46979 — 04 (2026/06)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය

**2026 - පෙබරවාරි**

**ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය**

**ක්‍රියාත්මක දිනය : ................................**

**ISBN : .................................**

**මුද්‍රණය : ................................**

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය

**2026**

පටුන


| | පිටුව |
|---|---|
| 1. හැඳින්වීම | 6 |
| **2. සාධාරණීකරණය** | **7** |
| **3. විෂය පථය** | **7** |
| 4. ප්‍රතිපත්තියේ පරමාර්ථ | 7 |
| 5. ප්‍රතිපත්තියේ අරමුණු | 8 |
| 6. ප්‍රතිපත්ති මූලධර්ම: | 8 |
| 7. ප්‍රතිපත්ති ප්‍රකාශන | 9 |
| 7.1 රජයේ වගකීම් හා කාර්යභාරය | 9 |
| 7.2 ප්‍රතිලාභීන්ගේ වගකීම් හා කාර්යභාරය | 9 |
| 7.3 ජල භාවිත අයිතීන් සහ වගකීම් | 9 |
| 7.4 ජල සම්පත් සැලසුම් කිරීම, සංවර්ධනය, කළමනාකරණය සහ සංරක්ෂණය | 10 |
| 7.5 අවශ්‍යතා සහ ප්‍රමුඛතා පදනම යටතේ ජල පරිමාවන් වෙන් කිරීම | 10 |
| 7.6 විවිධ ජල භාවිතයන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම | 10 |
| 7.7 සංරක්ෂණ, කළමනාකරණ, මෙහෙයුම් හා නඩත්තු පිරිවැය බෙදා හදා ගැනීම | 11 |
| 7.8 දත්ත හා තොරතුරු කළමනාකරණය | 11 |
| 7.9 පර්යේෂණ සහ සංවර්ධනය | 11 |
| 7.10 පුහුණුව සහ ධාරිතා වර්ධනය | 12 |
| **8. ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය** | 12 |
| 8.1 ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳ අමාත්‍ය කමිටුව | 12 |
| 8.1.1 කාර්යභාරය | 12 |
| 8.1.2 කමිටුවේ සංයුතිය | 12 |
| 8.2 ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුව (NWRMC) | 12 |
| 8.2.1 කාර්යභාරය | 12 |
| 8.2.2 කමිටුවේ සංයුතිය | 13 |
| 8.2.3 ආරාධිත නියෝජිතයෝ | 13 |
| 8.2.4 උපදේශක මට්ටමේ නියෝජනය | 13 |
| 8.3 ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය (NWRS) | 13 |
| 8.3.1 කාර්යභාරය | 13 |
| 8.3.2 සංයුතිය | 14 |
| **9. අභියාචනා ක්‍රමවේදය** | **14** |
| **පරිශිෂ්ටය** | 15 |

## ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය

**දැක්ම:**

*"ජල සම්පත සුරැකීමේ හා බෙදා හදා ගැනීමේ සම්ප්‍රදාය සහ තුලිත පරිසරයක් රැක ගැනීමේ අරමුණ අඛණ්ඩව පවත්වාගෙන යමින් තිරසර ජල සම්පත් භාවිතය තුළින් සංවර්ධිත දේශයක් කරා..."*

### 1. හැඳින්වීම

1.1 මිනිසාගේ මෙන්ම පෘථිවිය මත ජීවත් වන අනෙකුත් සියලු ජීවීන්ගේ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය ස්වභාවික සම්පත් අතර ජලය ප්‍රධාන ස්ථානයක් ගනී. පෘථිවි පෘෂ්ඨයෙහි 70% ක් පමණ ජලයෙන් වැසී පැවතියත්, විවිධ ආකාරයේ පරිභෝජනයන්ට සුදුසු පොළව මතුපිට සහ භූගතව පවතින ජල ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් ඉතා අල්පය.

1.2 වාර්ෂික වර්ෂාපතනයෙන් ලැබෙන මුළු ජල පරිමාව සැලකූ විට, ශ්‍රී ලංකාව ලෝකයේ අනෙකුත් බොහෝ රටවලට සාපේක්ෂව "ජලයෙන් පොහොසත්" රටක් වුවද, භූගෝලීය විෂමතාවය සහ මෝසම් සුළං රටාව අනුව වර්ෂාපතන ව්‍යාප්තියේ මෙන්ම ජල සුලභතාවයේ ඉහළ විචල්‍යතාවයක් පවතී.

1.3 ශ්‍රී ලංකාව මෙම දේශගුණික විචල්‍යතාවයට සාර්ථකව මුහුණදීම සඳහා, *"මෙබඳු දේශයෙහි වැස්සෙන් හටගත් ජලය මඳකුත් ලෝකෝපකාරයෙන් වෙන්ව කිසි කලෙකත් මුහුදට නො යේවා!"* යන මහා පරාක්‍රමබාහු රජතුමන් විසින් කළ ප්‍රකාශය ගුරු කොට ගනිමින්, පරිසරය රැක ගනිමින් සහ එහි භූ විෂමතාව ද උපයෝගී කර ගනිමින්, ඉතා විශිෂ්ට අයුරින් ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය සිදු කර ඇති බවට වර්තමානයේ ද කෘෂිකාර්මික, ගෘහස්ථ ජල සම්පාදන, කර්මාන්ත හා අනෙකුත් ක්ෂේත්‍රයන් සඳහා ජල සැපයුම වෙනුවෙන් සක්‍රීය සේවයක් ලබා දෙනු ලබන මහා වැව්, අමුණු, යෝධ ඇළ මාර්ග, මෙන්ම කුඩා වැව්වලින් සමන්විත එල්ලංගා පද්ධතීන් ද සාක්ෂි දරයි.

1.4 මෙරටට ලැබෙන සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 2000 ක් පමණ වන අතර, ඉන් ලැබෙන සමස්ත ජල පරිමාව දළ වශයෙන් ඝන මීටර බිලියන 130 ක් පමණ වේ. ජලය සහ කෘෂිකර්මය පිළිබඳ ගෝලීය තොරතුරු පද්ධතියෙහි (FAO – AQUASTAT -2023) සඳහන් පරිදි, ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන වාර්ෂික පුනර්ජනනීය මතුපිට ජල සම්පත් ප්‍රමාණය ඝන මීටර බිලියන 52 ක් ද, භූගත ජලය ඝන මීටර බිලියන 7.8 ක් ද, මතුපිට ජලය සහ භූගත ජලය අතර අතිච්ඡාදනය ඝන මීටර බිලියන 7 ක් ද වන අතර, ඒ අනුව, ශ්‍රී ලංකාවේ සමස්ත වාර්ෂික පුනර්ජනනීය ජල සම්පත් ප්‍රමාණය ඝන මීටර බිලියන 52.8 ලෙස තක්සේරු කර ඇත.

1.5 ගංගා ද්‍රෝණි 103 ක් මගින් මෙරට මුළු භූමි ප්‍රමාණයෙන් 90% කට වඩා වැඩි ප්‍රමාණයක් ආවරණය වන අතර, ඉතිරි ප්‍රදේශය ද කුඩා වෙරළබඩ ජල ධාරා ප්‍රදේශයන් 65 කින් පමණ ආවරණය වේ. තවද, වර්තමානය වන විට ගංගා ද්‍රෝණි කිහිපයක හැර ඉතිරි ද්‍රෝණීන්හි විවිධ ධාරිතාවන්ගෙන් යුත් වැව්, අමුණු, ජලාශ සහ ඇළ මාර්ග පද්ධතීන් රාශියක් ඉදිකර ඇති අතර, ජලය හිඟ ගංගා ද්‍රෝණි ස්වකීය ජල පෝෂක ප්‍රදේශ වලින් ලැබෙන ජලයට අමතරව අන්තර්ද්‍රෝණි හැරවුම් මගින් ද පෝෂණය කර ඇත. දිවයිනේ බහුතර ප්‍රදේශයක් ආවරණය වන ගංගා ද්‍රෝණි අතර පවතින මෙම අන්තර් සම්බන්ධතා හේතුවෙන් ශ්‍රී ලංකාවට අයත් මුළු භූමි ප්‍රදේශයම තනි පරිසර පද්ධතියක් ලෙස සැලකිය හැකිය.

1.6 තවද, ප්‍රමාණාත්මකව ජලය පරිමාවන් ලෙස භාවිත කරන ක්ෂේත්‍ර අතරින් කෘෂිකර්මය, නාගරික හා ගෘහස්ථ ජල සම්පාදනය සහ කර්මාන්ත යන ක්ෂේත්‍රයන් ප්‍රමුඛ වේ. ජලය සහ කෘෂිකර්මය පිළිබඳ ගෝලීය තොරතුරු පද්ධතිය (FAO – AQUASTAT 2023) අනුව, වාර්ෂිකව පරිහරණය කෙරෙන ඝන මීටර බිලියන 13 ක් පමණ වූ මුළු ජල පරිමාවෙන්, කෘෂිකර්මාන්තය සඳහා 87% ක් ද, නාගරික හා ගෘහස්ථ ජල සම්පාදනය සඳහා 6% ක් ද, කර්මාන්ත සඳහා 6% ක් ද ලෙස ආසන්න වශයෙන් පරිහරණය කෙරේ.

1.7 අතීතයේ සිට ප්‍රමුඛව පැවැති කෘෂිකාර්මික ජීවනෝපායන් සඳහා වන ජල භාවිතයන් පසුකාලීනව කර්මාන්ත වර්ධනය, තාක්ෂණික දියුණුව, ජීවන තත්ත්වයන් ඉහළ යෑම ආදිය හේතුවෙන් ජල විදුලි බල උත්පාදනය, ගෘහස්ථ ජල සම්පාදනය, කර්මාන්ත හා සේවා සඳහා සහ විනෝදාස්වාදය හා සංචාරක වැනි ක්ෂේත්‍ර සඳහා වන ජල අවශ්‍යතා ආදී ලෙස විවිධාංගීකරණය වී ඇත. ඒ අනුව වර්තමානය වන විට සංවර්ධිත ජල සම්පත් සඳහා වන ඉල්ලුම ඉහළ යමින් පවතින අතර අනාගත අවශ්‍යතා සඳහා තව මෙලෙස විවිධාංගීකරණය වූ ජල ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය සඳහා කලින් කලට ස්ථාපනය කරන ලද ආයතන ජාලයක් ද පවතින අතර එකී ආයතන වල විෂය පථයන් හා ව්‍යවස්ථාපිත කාර්යයන්හි නොගැලපීම්ද නිරීක්ෂණය වේ.

1.8 තවද, දේශගුණික විපර්යාස හේතුවෙන් නිර්මාණය වෙමින් පවතින වර්ෂාපතනයේ විචල්‍යතාවය ඉහළ යෑම, නියඟ, ගංවතුර හා නාය යෑම් වැනි ආපදා තත්ත්වයන් මෙන්ම භූගත ජලය ක්ෂය වීම සහ කෘෂි, කාර්මික හා ගෘහස්ථ අපද්‍රව්‍ය හේතුවෙන් ජලයේ ගුණාත්මකභාවය පිරිහීම වැනි තත්ත්වයන් ද ජල සම්පත ආශ්‍රිතව වර්ධනය වෙමින් පවතින ගැටළු වේ. එබැවින්, ශ්‍රී ලංකාවේ ජල සම්පතෙහි තිරසර පැවැත්ම තහවුරු කිරීමට අභියෝගාත්මක වන ගැටළු නිශ්චිත ලෙස හඳුනාගෙන පිළියම් යෙදීම සඳහා කඩිනම් ප්‍රතිපත්තිමය මැදිහත් වීමක් අත්‍යාවශ්‍ය වේ.

**2. සාධාරණීකරණය.**

ජාතික ජල සම්පත් ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම සඳහා කලින් කල උත්සාහයන් දැරුවද එය මෙතෙක් ක්‍රියාත්මක තත්වයට පත් කර ගැනීමට නොහැකි වී ඇති බැවින්, පහත දැක්වෙන අභියෝග හා අවශ්‍යතාවයන්ට මුහුණ දීම සඳහා ජාතික ජල සම්පත් ප්‍රතිපත්තියක් තිබිය යුතු බව අවබෝධ වේ.

2.1 ජල විද්‍යාත්මක දත්තවලට අනුව සමස්තයක් ලෙස මෙරට තුළ කිසිදු ජල හිඟයක් නොමැති වුවද, දේශගුණික විපර්යාසයන්හි බලපෑම මත මෝසම් සහ අන්තර් මෝසම් වර්ෂාපතනයේ විචල්‍යතාවයත් භූගෝලීය විෂමතාවයත්, වර්ෂාපතනයන්හි ඉහළ අන්තර් වාර්ෂික විචල්‍යතාවයත් හේතුවෙන් මෙරට ඇතැම් ප්‍රදේශයන්හි ජලයේ සුලභ තත්ත්වයන් මෙන්ම තවත් ප්‍රදේශයන්හි ජල හිඟ තත්ත්වයන් ද ඇතිවීම.

2.2 නාගරීකරණය, කර්මාන්ත ක්ෂේත්‍රය පුළුල් වීම, කෘෂිකර්මාන්තයේ විවිධාංගීකරණය, සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය, විනෝදාත්මක අවශ්‍යතා ආදිය හා ඒ හේතුවෙන් ඉහළ යන ආර්ථික ක්‍රියාකාරකම් ද පවත්නා ජල සම්පත් හා ජල දේහයන් ආශ්‍රිත භාවිතයන් සඳහා වන ඉල්ලුම විවිධාංගීකරණය කරමින් තවදුරටත් ජල ඉල්ලුම ඉහළ යාම.

2.3 ජාතික අවශ්‍යතාවන් අරමුණු කර ගනිමින් මතුපිට ජල සම්පත් සැලසුම් කිරීම, සංවර්ධනය හා කළමනාකරණය මෙන්ම, භූගත ජල සම්පත් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම ද මගින් ප්‍රමාණවත් පරිදි සියලු පාර්ශවයන් වෙත ජලය සඳහා සාධාරණ සහ යුක්ති සහගත ප්‍රවේශයක් සහතික කිරීම අත්‍යාවශ්‍ය වීම.

2.4 ජීවයේ පැවැත්මට අත්‍යාවශ්‍ය සාධකයක් මෙන්ම සීමිත සම්පතක් වන ජල සම්පත කළමනාකරණය පිළිබඳව අප රට මුහුණ දෙන ප්‍රධාන අභියෝග ලෙස;

I විවිධ ආයතනික අරමුණු සඳහා පිහිටුවා ඇති සංකීර්ණ ආයතනික පද්ධතියක් පොදු අවශ්‍යතා මත ජාතික මට්ටමේදී මෙන්ම ප්‍රාදේශීය මට්ටම් වලදී ද මනා ලෙස සම්බන්ධීකරණය කිරීම.

II. දේශගුණික විපර්යාස නිසා ඇතිවෙමින් පවතින ජල සම්පත්වල සුලබතාවයේ විචල්‍යතාවය කළමනාකරණය කිරීම. (උදා: තෙත් කලාපයට වැසි අධික වීම හා වියළි කලාපය තව දුරටත් වියලි බවට පත්වීම)

III. වැඩිවන ජනගහනයට අවශ්‍ය ආහාර නිෂ්පාදනය මගින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම.

IV. සැමට සුරක්ෂිත පානීය ජලයට ප්‍රවේශවීමේ අයිතිය තහවුරු කිරීම.

V. නාගරීකරණය, ජනගහන වර්ධනය හා කාර්මීකරණය නිසා ඇතිවන ජල දූෂණය පාලනය කිරීම.

VI. ජල විදුලිය උත්පාදනය, කර්මාන්ත සංවර්ධනය, සංචාරක කටයුතු ප්‍රවර්ධනය, ගෘහස්ථ ජල සැපයුම් වර්ධනය , අභ්‍යන්තර ධීවර කටයුතු වැනි ජල අවශ්‍යතා හේතුවෙන් වැඩි වන ජල ඉල්ලුම කළමනාකරණය කිරීම.

VII. ඉහත සඳහන් ජල අවශ්‍යතා සපුරන අතරම පරිසරයේ තුලනාත්මක බව ආරක්ෂා කර ගැනීම මෙන්ම ජල මූලාශ්‍ර හා ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීමේ දැඩි අවශ්‍යතාවක් පැන නැගී තිබීම.

ඒ අනුව, ජල සම්පත් ආශ්‍රිත විභවයන් වඩාත් සඵලදායීව යොදා ගනිමින් ශ්‍රී ලංකාව තිරසරව සංවර්ධිත දේශයක් ලෙස ගොඩනැංවීම උදෙසා ජල සම්පතට අදාළ එක් එක් ක්ෂේත්‍රයන් සඳහා යොමු වන ආයෝජනයන් සාකල්‍ය ලෙස යොදා ගනිමින් සමස්ත ජාතික දර්ශනයට අනුගත වන අයුරින් ජල සම්පත් උපයෝගී කර ගැනීම පිණිස මෙන්ම ජල සම්පත් කළමනාකරණ තීරණ ගැනීමේදී රජය, පාර්ශවකාර ආයතන හා ප්‍රතිලාභීන් අතර මනා සම්බන්ධතාවයක් හා අවබෝධයක් ගොඩ නැගීම සඳහා පුළුල් ජාතික ජල සම්පත් ප්‍රතිපත්තියක අවශ්‍යතාව හා එය සවිබල ගැන්වීම සඳහා සුදුසු නීති පද්ධතියක අවශ්‍යතාව තහවුරු වේ.

**3. විෂය පථය**

ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ දේශ සීමාව තුළ සාගර ජලය හැර අනෙකුත් සියලු ජල සම්පත් සඳහා අදාළ වේ.

**4. ප්‍රතිපත්තියේ පරමාර්ථ:**

1. ජල සම්පත හා බැඳුනු දේශීය උරුමය හා ඓතිහාසික අත්දැකීම් මෙන්ම නවීන තාක්ෂණික උපක්‍රම ද සුදුසු පරිදි යොදා ගනිමින් ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් තිරසර ජලසම්පත් සැලසුම්කරණය, සංවර්ධනය, ඵලදායී භාවිතය හා සංරක්ෂණය තහවුරු කිරීම.

2. සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා සංවර්ධිත ජල සම්පත් භාවිතයන් මෙන්ම නව ජල සම්පත් සංවර්ධනයන්ට අදාළ විවිධ ක්ෂේත්‍රයන්හි ජල අවශ්‍යතාව සපුරාලන උපායමාර්ගික සැලසුම් දේශීය වශයෙන් ඇගයෙන ඒකාබද්ධ ප්‍රවේශයක් සහිතව සිදු කිරීම.

**5. ප්‍රතිපත්තියේ අරමුණු**

(1) සියලුම වර්තමාන සහ අනාගත ජල භාවිතයන් සඳහා සාධාරණ සහ යුක්ති සහගත ප්‍රවේශයක් සහතික කිරීම.

(2) මතුපිට හා භූගත ජලයේ ගුණාත්මකභාවය සහ ඒ ආශ්‍රිත පාරිසරික පද්ධති සහ ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම, ප්‍රතිස්ථාපනය හා ශක්තිමත් කිරීම.

(3) ජල සම්පත් දූෂණය වීම හා නාස්තිය වලක්වා ගැනීම සඳහා පුරවැසි ආකල්ප සංවර්ධනය කිරීම, දැනුවත් කිරීම හා නියාමනය.

(4) භූගත ජල සම්පතෙහි තිරසර පැවැත්ම සඳහා අධිභාවිතාව වැලැක්වීම, ජල ප්‍රතිආරෝපණය හා භූගත ජල නිධි මත පදනම්ව භූගත ජල සම්පත තිරසර ලෙස සංවර්ධනය කිරීම, කළමනාකරණය කිරීම හා සංරක්ෂණය ශක්තිමත් කිරීම.

(5) ඉල්ලුමට සරිලන ලෙස ජල සැපයුම ලබා දීමට අපහසු අවස්ථාවන්හිදී ප්‍රමුඛතා නිර්ණය කිරීම, ජලය බෙදාහදා ගැනීම හා පරිහරණය ආශ්‍රිත ගැටළු හා අභියෝග කළමනාකරණය.

(6) දේශගුණික විපර්යාස හේතුවෙන් ජලය පදනම්ව සියලු ක්ෂේත්‍රයන්ට සිදුවන බලපෑම්වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම.

(7) ජල සම්පත් සම්බන්ධ සියලු කාර්යයන්ට අදාළව, ඒකාබද්ධ හා සාකල්‍ය ප්‍රවේශයකින් ජාතික, පළාත් හා ප්‍රාදේශීය අවශ්‍යතාවන් ද සැලකිල්ලට ගෙන ජාතික මට්ටමින් තීරණ ගැනීමේ යාන්ත්‍රණයක් හා මෙහෙයුම් හා අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

(8) තීරණ ගැනීමට ප්‍රමාණවත් පරිදි, ජල සම්පත පිළිබඳ එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළ දත්ත හා තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා මධ්‍යගත ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

(9) රටේ සංවර්ධනය සඳහා සාධනීය ලෙස උපයෝගී කරගත හැකි ජල සම්පත හා බැඳුනු උරුමයන් හා සංස්කෘතීන් වැනි විභවයන් ඔස්සේ නව මානයන් පිළිබඳ ගවේෂණය කිරීම.

(10) ජල සම්පත් සංවර්ධනය, කළමනාකරණය, පරිහරණය හා සංරක්ෂණය ආදී ක්ෂේත්‍රයන් ආවරණය කිරීමට ස්ථාපිත නීති සංශෝධනය, පාරම්පරික හා නවීන තාක්ෂණ යෙදවුම් සුදුසු පරිදි භාවිතය සහ ආයතන ප්‍රතිසංවිධානය කිරීම හෝ ශක්තිමත් කිරීම.

**6. ප්‍රතිපත්ති මූලධර්ම:**

ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය පහත සඳහන් මූලධර්ම මත පදනම් වනු ඇත.

**6.1** ජලය යනු, ජීවය, පරිසර පද්ධති හා මානව ක්‍රියාකාරකම් ප්‍රශස්තව පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වන අවදානමට ලක්වෙමින් පවතින පුනර්ජනනීය ස්වභාවික සම්පතක් ලෙස පිළි ගත යුතුය.

**6.2** ජල සම්පත ශ්‍රී ලංකා රාජ්‍යයට අයත් වන අතර රජය විසින් එහි භාරකාරීත්වය දැරිය යුතුය.

**6.3** සියලුම ජීවී විශේෂවල සහ පරිසර පද්ධතිවල පැවැත්ම සඳහා ප්‍රමාණවත් ජලය පැවතිය යුතු බව පිළිගත යුතුය.

**6.4** 2010 වසරේදී එක්සත් ජාතීන්ගේ මහා සභාව විසින් පිළිගත් පරිදි "ආරක්ෂිත සහ පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂාව සඳහා ප්‍රවේශය" මානව හිමිකමක් ලෙස පිළිගත යුතුය.

**6.5** මෙරට ආර්ථික හා සමාජයීය යහපැවැත්ම උදෙසා විවිධාංගීකරණය වන ජල අවශ්‍යතා හා ඉල්ලුම සැපිරීම සඳහා නව ජල සම්පත් සංවර්ධනය මෙන්ම ජල සම්පත් හා ජල දේහයන්හි භාවිතයේ කාර්යක්ෂමතාව, ඵලදායිතාව හා සංරක්ෂණය ඉහළ නැංවීම සඳහා කටයුතු කළ යුතුය.

**6.6** ජල සම්පත් සැලසුම් කිරීම, සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය ප්‍රාදේශීය සමානාත්මතාව සුරකෙන පරිදි ප්‍රමුඛතා සහ අනන්‍යතා සැලකිල්ලට ගනිමින් විෂමතාවයන් අවම වන පරිදි සිදු කල යුතුය.

**6.7** ජල ප්‍රභව, ජල මූලාශ්‍ර හා ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිත දූෂණය, හායනය සහ ජල මූලාශ්‍ර වලින් අධික ලෙස උකහාගැනීම නියාමනය කිරීම මගින් සියලු ජල ප්‍රභව හා ජල මූලාශ්‍ර ප්‍රශස්ත ලෙස සංරක්ෂණය කළ යුතුය.

**6.8** අපජල පිරිපහදුව, පිලිසැකසුම සහ නැවත භාවිතය දිරිමත් කළ යුතුය.

**6.9** ලෝක උරුමයන් හා ජාතික උරුමයන් සේ සැලකෙන වැසි වනාන්තර, තෙත් බිම්, අභය භූමි හා වාරි කර්මාන්ත ආශ්‍රිත ජල සම්පත් වල සහ ජල පෝෂක ප්‍රදේශ වල සුරක්ෂිතභාවය හා තිරසර බව පවත්වාගෙන යෑම හා සංරක්ෂණය කිරීම ජාතික කර්තව්‍යයක් සේ සලකා කටයුතු කළ යුතුය

**6.10** දේශගුණික විපර්යාස හේතුවෙන් ජල සම්පත් ක්ෂේත්‍රයට වන අහිසි බලපෑම් අවම කිරීම සඳහා උචිත ආංශික හා ජාතික මට්ටමේ අනුවර්තන පියවර ගත යුතුය.

**6.11** ජල සම්පත් කළමනාකරණය සාකල්‍ය කර්තව්‍යයක් වන බැවින්, ජල සම්පත් සැලසුම්කරණය, සංවර්ධනය, භාවිතය හා සංරක්ෂණයට අදාළ සියලු සාධක සලකා බැලීම සහතික වනු පිණිස ජල සම්පත් කළමනාකරණය ඒකාබද්ධ හා සහභාගීත්ව ප්‍රවේශයක් මත ශක්තිමත් ආයතන පද්ධතියක් මගින් සිදු කළ යුතුය.

## 7. ප්‍රතිපත්ති ප්‍රකාශන

මෙම ප්‍රතිපත්තිය මගින් අපේක්ෂිත පරමාර්ථයන් සාක්ෂාත් කරගැනීම සඳහා වන ප්‍රතිපත්ති ප්‍රකාශන පහත දැක්වේ.

### 7.1. රජයේ වගකීම් හා කාර්යභාරය

රටේ සමස්ත ජනතාව වෙනුවෙන් ජල සම්පත් වල භාරකාරිත්වය දැරීමත්, එය පොදු ජනතාවගේ සහ පරිසර පද්ධතියේ තිරසර යහපැවැත්ම උදෙසා ඒකාබද්ධ ප්‍රවේශයක් තුළ ප්‍රශස්ත ලෙස සැලසුම් කිරීම, සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය කිරීම හා ඒ සඳහා වන මූල්‍ය ආයෝජනය, පුද්ගල හා ආයතනික ධාරිතා සංවර්ධනය මෙන්ම නියාමනය සඳහා අවශ්‍ය නීති හා රෙගුලාසි පැනවීම.

දැනටමත් ජල සම්පත් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ කාර්‍ය භාරයන් ඉටුකරනු ලබන රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල වගකීම් ශක්තිමත් කරමින් දේශීය හා අන්තර්ජාතික වශයෙන් රජය විසින් ඇතිකරගත් සම්මුතීන් අනුව යමින් ජාතික, පළාත් හා ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත ව්‍යවස්ථාපිත නෛතික රාමු තුළ වගකීම් පැවරීම.

සමස්තයක් ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්මයන්ට අනුකූලව ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ කාලීන අවශ්‍යතා අනුව යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම.

### 7.2. ප්‍රතිලාභීන්ගේ වගකීම් හා කාර්යභාරය

මෙරට ජල සම්පත් පරිහරණය කරනු ලබන සියලු පාර්ශවයන් ජල සම්පත් භාවිතය අනුව සෘජු හෝ වක්‍ර ප්‍රතිලාභීන් වන අතර ඒ අනුව, කෘෂිකර්මාන්තය, ගෘහස්ථ පරිභෝජනය, කර්මාන්ත හා සේවා ආදිය සඳහා ජලය පරිමාවන් ලෙස භාවිත කරනු ලබන පාර්ශවයන් සහ ජලයේ විභවය, ජල දේහයන් සහ ජල පරිසරය ආශ්‍රය කරගත් ජල විදුලිබල උත්පාදනය, අභ්‍යන්තර ධීවර හා ජල ජීවී කර්මාන්තය, සංචාරක කර්මාන්තය ආදියෙහි භාවිතයන් සිදු කරනු ලබන පාර්ශවයන් සෘජු ප්‍රතිලාභීන් ලෙසත් ඉහත සෘජු ප්‍රතිලාභී පාර්ශවයන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවාවන්හි පාරිභෝගිකයින් හා සේවාලාභීන් වක්‍ර ප්‍රතිලාභීන් ලෙසත් සැලකීම.

කාර්යක්ෂමව හා ඵලදායීව ජල සම්පත් භාවිතය සහ ජල දූෂණය වැළැක්වීම හා ජලයේ ගුණාත්මකබව නියාමනය නවීන විද්‍යාත්මක කළමනාකරණ ප්‍රවේශයන්ට අනුගතව සිදු කිරීම මෙන්ම ඓතිහාසික වශයෙන් ජලය හා බැඳුනු සංස්කෘතික උරුමයන්ට ගරු කරමින් කටයුතු කිරීම.

සහභාගීත්ව කළමනාකරණ ප්‍රවේශයන්ට සුදුසු පරිදි අනුගත වීම හා ජල සම්පත් ආශ්‍රිත යටිතල පහසුකම් කළමනාකරණ, මෙහෙයුම් හා නඩත්තු කිරීම් වලට දායක වීම සඳහා සාමූහිකව එකඟ විය හැකි ක්‍රමවේද අනුගමනය කිරීම.

### 7.3. ජල භාවිත අයිතීන් සහ වගකීම්

ආරක්ෂිත හා පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂාව සඳහා වන ජලයට ප්‍රවේශ වීමට ඇති අයිතිය මානව හිමිකමක් බව පිලිගැනීම.

මේ වනවිට සංවර්ධනය කර ඇති ජල සම්පත් වල මුල් භාවිතයන් සඳහා වන අයිතිය මෙන්ම ශ්‍රී ලංකාවේ දැනටමත් නෛතික ප්‍රතිපාදන පවතින ගං දැලේ භුක්තිකරුවන්ගේ ජල භාවිතයට ඇති අයිතිය පිළිගැනීම හා මෙරට ජලය හා බැඳුනු සම්ප්‍රදායන්ට හා සංස්කෘතික අගයන්ට ගරු කරමින්, විවිධාංගීකරණය වන අවශ්‍යතා සඳහා ජල භාවිතයට ඇති අයිතිය තහවුරු කිරීම.

සියලු ජීවී විශේෂවල සහ පරිසර පද්ධතිවල පැවැත්ම සඳහා අවශ්‍ය අවම ජල අවශ්‍යතාවය හඳුනා ගනිමින් සාධාරණ ලෙස ජල සැපයුම සහතික කිරීම.

**7.4. ජල සම්පත් සැලසුම් කිරීම, සංවර්ධනය, කළමනාකරණය සහ සංරක්ෂණය**

ජල සම්පත් සැලසුම් කිරීමේ දී මතුපිට ජල සම්පත් මෙන්ම භූගත ජල සම්පත්වල විභවයන් හා වැසි ජලය රැස් කිරීමේ විභවයන් සැලකිල්ලට ගැනීම.

ජාතික සංවර්ධන අවශ්‍යතා අනුව ජල සම්පත් සැලසුම් කිරීම, ස්වභාවික ජල විද්‍යාත්මක මායිම් මෙන්ම අන්තර් ද්‍රෝණි හැරවුම් ශක්‍යතාවන්ද සැලකිල්ලට ගනිමින් සිදු කිරීම.

නව ජල සම්පත් සංවර්ධනයේ අවශ්‍යතාව හඳුනා ගැනීමේ දී සංවර්ධිත ජල සම්පත් හා සංවර්ධන විභවයෙන් යුතු අසංවර්ධිත ජල දේහයන් ඉහළ කාර්යක්ෂමතාවකින් හා ඵලදායීතාවයකින් භාවිත කිරීමේ විභවයන් කෙරෙහි මෙන්ම දේශගුණික විපර්යාස මගින් ඇති වී ඇති හෝ පුරෝකථනය කරනු ලබන නියං හා ගංවතුර බලපෑම් අවම වන පරිදි කටයුතු කිරීම හා කඩිනමින් හානි පූරණය කිරීම හෝ අනුගත වීමේ ක්‍රියාවලීන් දිරිමත් කිරීම සඳහා කටයුතු කිරීම.

ජල සම්පතෙහි විචල්‍යතාවයන් හා විවිධාංගීකරණය වන ඉල්ලුම සැලකිල්ලට ගෙන ජල සම්පත් සංවර්ධනයේදී පානීය හා සනීපාරක්ෂාව සඳහා වන ජල අවශ්‍යතාවන් ද ඇතුළුව බහු කාර්ය ප්‍රවේශය පිළිගැනීම කෙරෙහි දැඩි සැලකිල්ලක් යොමු කිරීම.

මතුපිට ජල ප්‍රභව, ජල මූලාශ්‍ර හා ජල පෝෂක ආශ්‍රිත පරිසර දූෂණය සහ ජල පෝෂක ප්‍රදේශ හායනය නියාමනය කිරීම, භූගත ජල සම්පත් දූෂණය සහ අධික ලෙස උකහාගැනීම නියාමනය කරමින් හා භූගත ජලධරයන්හි සමතුලිතතාව පවත්වා ගනිමින් සියලු භූගත ජල මූලාශ්‍ර ප්‍රශස්ත ලෙස සංරක්ෂණය කිරීම.

ජල මූලාශ්‍රවල සුරක්ෂිතතාව, තිරසර පැවැත්ම හා ගං වතුර පාලනය ද අදාළ කරගනිමින් තෙත් බිම් සංරක්ෂණය සිදු කිරීම.

තාක්ෂණිකව යෝග්‍ය නිර්මිත හා ජල ශක්ති විද්‍යාත්මක ක්‍රම භාවිතයෙන් ගංඟා ඔස්සේ කරදිය ඇතුල්වීම පාලනය කිරීමට කටයුතු කිරීම.

කෘෂිකර්ම, ගෘහස්ථ , පාරිසරික, කර්මාන්ත, ධීවර, බල ශක්ති උත්පාදන, විනෝදාස්වාදය ආදී අවශ්‍යතාවයන්ට අදාළව ජල සම්පත් සැලසුම්කරණය, සංවර්ධනය, කළමනාකරණය හා සංරක්ෂණය කිරීමේ දී අදාළ පාර්ශවයන් සුදුසු පරිදි සහභාගී කරවා ගැනීම.

**7.5. අවශ්‍යතා සහ ප්‍රමුඛතා පදනම යටතේ ජල පරිමාවන් වෙන් කිරීම**

විවිධාංගීකරණය වන ආංශික ජල අවශ්‍යතා ලබා දීම සඳහා අදාළ පාර්ශවයන්ගේ ද සහභාගීත්වයෙන් ජාතික මට්ටමේ සම්බන්ධීකරණයක් සහිතව සිදු කිරීමට හැකිවන පරිදි නිශ්චිත ක්‍රියාත්මක යාන්ත්‍රණයක් ඇති කිරීම.

තත්කාලීනව පවතින ජල පරිමාවන් සියලු අවශ්‍යතාවන් සහ ඉල්ලීම් සැපිරීමට ප්‍රමාණවත් නොවන බව පුරෝකථනය කර ඇති අවස්ථාවල දී, පානීය හා සනීපාරක්ෂක ජල අවශ්‍යතා, ආහාර සුරක්ෂිතතාව සහ පාරිසරික අවශ්‍යතාවන් ප්‍රමුඛ ජල අවශ්‍යතා ලෙස සලකමින්, අවස්ථාවෝචිත හා සාධාරණ ලෙස අන්‍යෝන්‍ය ප්‍රමුඛතා සැලසෙන පරිදි අදාළ සියලු ජල අවශ්‍යතා සම්බන්ධයෙන් එකඟතාවන්ට එළඹෙමින් කටයුතු කිරීම.

ජාතික මට්ටමේ සම්බන්ධීකරණය යටතේ ගනු ලැබූ තීරණ හා එකඟතාවන් ක්‍රියාත්මක වීම සහතික කරනු වස් පාර්ශවකාර ආයතනවල විවිධ මට්ටම්වල මෙහෙයුම් යාන්ත්‍රණයන් සම්බන්ධීකරණය කිරීම.

**7. 6. විවිධ ජල භාවිතයන්ගේ කායීක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම**

විවිධ ජල භාවිතයන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම හා ජල සම්පත් දූෂණය වීම හා නාස්ති වීම වැළැක්වීම, හා ඉහළ ඵලදායිතාවයෙන් භාවිතා කිරීම සඳහා වන ක්‍රමානුකූල මධ්‍යගත කළමනාකරණ ක්‍රමවේදයක්ද, විමධ්‍යගත ක්‍රියාකාරි සැලසුම්ද සියලු පාර්ශ්වකරුවන්ගේ දායකත්වයෙන් හා එකඟතාවයෙන් සකස් කර ඊට අදාළ උපාය මාර්ගික සැලසුම් හඳුනා ගනිමින් ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.

ඒ සඳහා වන මාර්ගෝපදේශ හා කාර්ය සාධන නිර්ණායක හඳුන්වා දෙන අතරම එක් එක් ක්ෂේත්‍රයන් යටතේ මෙන්ම ජාතික මට්ටමේ අධීක්ෂණ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම.

**7.7. සංරක්ෂණ, කළමනාකරණ, මෙහෙයුම් හා නඩත්තු පිරිවැය බෙදා හදා ගැනීම**

සංවර්ධිත ජල සම්පත් කළමනාකරණයට අදාළ වේලි, නිර්මිත හා අනිකුත් අදාළ යටිතල පහසුකම්වල මෙහෙයුම් හා නඩත්තු නිසි ලෙස සිදු කිරීම සහතික කිරීම.

ජල පෝෂක ප්‍රදේශවල පාරිසරික හානි, ජල සම්පත් දූෂණය හා අධික ලෙස උකහා ගැනීමෙන් සිදු කරන හානි වෙනුවෙන් හානි පූර්ණ වන්දි අයකර ගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ග්‍රාමීය පානීය ජල සම්පාදනය, වාරි කෘෂිකර්මාන්තය හා අභ්‍යන්තර ධීවර කර්මාන්තය සඳහා රජය මගින් දරනු ලබන කළමනාකරණ, මෙහෙයුම් හා නඩත්තු වියදම් අවම කර ගැනීමට ප්‍රජා මූල සංවිධාන සඳහා දැනටමත් ස්ථාපිත කර ඇති දායක වීමේ ක්‍රමවේදයන් තව දුරටත් ශක්තිමත් කිරීම.

ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා සෘජුව දායක වන කෘෂිකර්මාන්තය හා මිරිදිය ධීවර කර්මාන්තය හැර, ව්‍යාපාරික අරමුණින් සිදු කරන කර්මාන්ත හා නිෂ්පාදන ක්‍රියාකාරකම් සඳහා මතුපිට හෝ භූගත ජලය පරිහරණයට අදාළව රජයට දැරීමට සිදුවන සංරක්ෂණ, කළමනාකරණ, මෙහෙයුම්, නඩත්තු හා නියාමන පිරිවැය ආයෝජකයන් මගින් ආවරණය කර ගැනීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීම. *(මෙම ක්‍රමවේදය, අදාළ කර්මාන්ත හා ඒවායේ විශාලත්ව සීමා හා අදාළ ගාස්තු, ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ රෙගුලාසි යටතේ හඳුන්වාදීමට නියමිතය.)* දැනටමත් විවිධ අණ පනත් යටතේ අය කරනු ලබන රාජ්‍ය භාගයන් එලෙස ම අය කරනු ඇත.

**7.8. දත්ත හා තොරතුරු කළමනාකරණය**

ජාතික මට්ටමින් ජල සම්පත් සැලසුම් කිරීම, සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණයට අදාළ දත්ත හා තොරතුරු සංක්ෂිප්තව ගොනු කර පවත්වාගෙන යාම සඳහා මධ්‍යගත දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම.

ඒ අනුව තීරණ ගැනීමට ප්‍රමාණවත් පරිදි, ජල සම්පත පිළිබඳ එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළ දත්ත හා තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා මධ්‍යගත ක්‍රමවේදයක් ඇති කිරීම.

ජල සම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී දත්ත මත පදනම් වූ විද්‍යාත්මක ප්‍රවේශයක් අනුගමනය කිරීමට හැකිවන පරිදි අදාළ වගකීම් දරන ආයතනවල දත්ත හා තොරතුරු කළමනාකරණය සඳහා අවශ්‍ය පරිදි භෞතික හා මානව සම්පත් සංවර්ධනය සිදු කිරීම.

රජයේ ආයතන හෝ පාර්ශව මගින් සිදු කරන දත්ත රැස් කිරීම් ද්විතීයකරණය නොවන පරිදි සිදු කිරීම සඳහා මනා අන්‍යෝන්‍ය අවබෝධයක් හා සම්බන්ධීකරණයක් ඇති කිරීම.

ජල සම්පත් ක්ෂේත්‍රයට අදාළව කටයුතු කරන ආයතන මගින් රැස්කරන මතුපිට ජල සම්පත් හා භූගත ජල සම්පත් පිළිබඳ දත්ත අනෙකුත් ආයතන හා පාර්ශවයන් සමඟ සුදුසු පරිදි බාධාවකින් තොරව හුවමාරු කර ගැනීමට ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

රජයට පරිබාහිර පාර්ශවයන් වෙත දත්ත හා තොරතුරු ලබා දීමේ දී එම දත්ත හා තොරතුරු රැස්කිරීම හා සැකසීම වෙනුවෙන් දරන ලද පිරිවැය සුදුසු පරිදි අයකර ගැනීමට පොදුවේ ක්‍රියාත්මක කළ හැකි සාධාරණ අයකිරීම් ක්‍රමවේදයක් ඇති කිරීම.

**7.9. පර්යේෂණ සහ සංවර්ධනය**

රටේ සංවර්ධනය සඳහා සාධනීය ලෙස උපයෝගී කරගත හැකි ජල සම්පත හා බැඳුනු උරුමයන් හා සංස්කෘතීන් ඇතුළු අනෙකුත් විභවයන් පිළිබඳ එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළව ගවේෂණය කිරීම.

ජල සම්පත් ක්ෂේත්‍රයේ නව මානයන් ගවේෂණය කිරීම පිණිස නවීන විද්‍යාත්මක පර්යේෂණ ක්‍රම අනුගමනය කරමින් දේශීය හා විදේශීය අධ්‍යයන ආයතන හා පාර්ශව සමග සම්බන්ධ වෙමින් සිදු කළ යුතු පර්යේෂණ හා සංවර්ධන කටයුතු ශක්තිමත් කිරීම හා ඒ සඳහා දිරිගැන්වීම සිදු කිරීම.

ජල සම්පත් ක්ෂේත්‍රයට අදාළව සිදු කරන පර්යේෂණවල ප්‍රතිඵල හා සොයා ගැනීම් අදාළ සංවර්ධන සැලසුම්කරුවන්, පරිශීලකයින් හා පර්යේෂකයන් අතර හුවමාරුව හා අවශ්‍යතා අනුව ප්‍රචාරණය කිරීම.

ජල විද්‍යාත්මක හා ජල ශක්ති යාන්ත්‍රණයන් හඳුනා ගැනීම සඳහා විද්‍යාත්මකව වලංගු වූ අධ්‍යයන ආකෘතීන් හා තාක්ෂණික මෙවලම් සුදුසු පරිදි භාවිතය සහතික කිරීම මගින් ජල සම්පත් වැඩිදියුණු කිරීම හා කළමනාකරණය සිදු කිරීම.

**7.10. පුහුණුව සහ ධාරිතා වර්ධනය**

තම භූමිකා කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කළ හැකිවන පරිදි, ජල සම්පත් ක්ෂේත්‍රයට අදාළ පුද්ගලයින් පුහුණු කිරීම හා සුදුසු පරිදි අවශ්‍ය භෞතික සම්පත් ලබා දීම මගින් ධාරිතා සංවර්ධනය සිදු කිරීම.

ජල සම්පත් සංරක්ෂණය සහ කාර්යක්‍ෂම හා ඵලදායි භාවිතය පිළිබඳව ඍජු හා වක්‍ර ප්‍රතිලාභීන් දැනුවත් කිරීම හා ධාරිතා වර්ධනය මගින් ඔවුන්ගේ කාර්යභාරය ප්‍රශස්ත අයුරින් ඉටු කිරීමේ හැකියාව හා ආකල්ප වර්ධනය සිදු කිරීම.

ජල සම්පත් සංරක්‍ෂණය සහ එහි කාර්යක්‍ෂම හා ඵලදායී භාවිතය පිළිබඳ මූලික අධ්‍යාපනය පාසල් විෂය මාලාව තුළින් ලබා දීමෙන් ආකල්ප වර්ධනය කිරීමට කටයුතු කිරීම.

**08. ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය**

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා ජල සම්පත් සැලසුම්කරණය, සංවර්ධනය,කළමනාකරණය හා සංරක්ෂණයට අදාළ කාර්යයන් හා කර්තව්‍යයන් සඳහා වගකීම දරන ආයතන හා අනෙකුත් පාර්ශවයන් සහභාගී කර ගනිමින් ජාතික මට්ටමේ ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ. ජතික වශයෙන් බලපෑම් ඇතිවිය හැකි විශේෂිත අවස්ථාවලදී සහ නියං සහ ගංවතුර වැනි ආපදා අවස්ථාවලදී තාක්ෂණික මෙන්ම සමාජ, දේශපාලන තත්වයන්ද සැලකිල්ලට ගෙන තීරණ ගැනීම සඳහා ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුවට උපදෙස් ලබා දීම සඳහා **ජල සම්පත් ප්‍රතිපත්ති පිළිබඳ අමාත්‍ය කමිටුවක්ද-(Committee of Ministers on Water Resources Policy )** ජාතික මට්ටමේ තීරණ ගැනීම සඳහා **ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුවක්ද (National Water Resource Management Committee - NWRMC)**, එම කමිටුවට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම සඳහා මෙන්ම සම්බන්ධීකරණ කටයුතු සඳහා වාරිමාර්ග විෂය භාර අමාත්‍යාංශය යටතේ **ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලයක් (National Water Resources Secretariat-NWRS)** ද ස්ථාපනය කෙරේ.

**8.1. ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳ අමාත්‍ය කමිටුව (Committee of Ministers on Water Resources Policy)**

**8.1.1 කාර්යභාරය**

ජාතික වශයෙන් බලපෑම් ඇතිවිය හැකි විශේෂිත අවස්ථාවලදී මෙන්ම ජාතික වශයෙන් බලපෑම් ඇතිවිය හැකි දරුණු නියං හා ගංවතුර වැනි ආපදා අවස්ථාවලදී තාක්ෂණික මෙන්ම සමාජ දේශපාලන සියලු තත්වයන් සැලකිල්ලට ගෙන තීරණ ගැනීම සඳහා ජාතික ජල සම්පත් කලමනාකරණ කමිටුවට උපදෙස් දීම මෙන්ම අභියාචනා හා දුක් ගැනවිලි සමාලෝචනය කර අවසන් තීරණ ලබා දීම ජාතික **ජල සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳ අමාත්‍ය කමිටුවේ ( Committee of Ministers on Water Resources Policy)** කාර්යය භාරය වේ.

**8.1.2. කමිටුවේ සංයුතිය**

**පහත දැක්වෙන සංයුතියෙන් යුත් ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳ අමාත්‍ය කමිටුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති විසින් පත් කරනු ඇත.**

| | | | |
|---|---|---|---|
| 1. | අග්‍රාමාත්‍ය | - | සභාපති |
| 2. | වාරිමාර්ග විෂය භාර අමාත්‍ය | - | සාමාජික |
| 3. | කෘෂිකර්ම විෂය භාර අමාත්‍ය | - | සාමාජික |
| 4. | ජල සම්පාදන විෂය භාර අමාත්‍ය | - | සාමාජික |
| 5. | බල ශක්ති විෂය භාර අමාත්‍ය | - | සාමාජික |
| 6. | පරිසර විෂය භාර අමාත්‍ය | - | සාමාජික |
| 7. | කර්මාන්ත විෂය භාර අමාත්‍ය | - | සාමාජික |
| 8. | ධීවර කටයුතු විෂය භාර අමාත්‍ය | - | සාමාජික |
| 9. | සංචාරක කටයුතු විෂය භාර අමාත්‍ය | - | සාමාජික |
| 10. | ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍ය | - | සාමාජික |
| 11. | පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර අමාත්‍ය | - | සාමාජික |

**මෙම කමිටුවට අදාළ පහසුකම් සැලසීම හා ලේඛන පවත්වාගෙන යාම ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය විසින් ඉටු කරණු ඇත.**

**8.2. ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුව (NWRMC)**

**8.2.1 කාර්යභාරය**

ශ්‍රී ලංකාවේ ජල සම්පත් සැලසුම්කරණය, සංවර්ධනය, කළමනාකරණය හා සංරක්ෂණය සම්බන්ධයෙන් ජාතික මට්ටමේ උපායමාර්ගික තීරණ ගැනීමේ දී ඉහළ මට්ටමේ බලයක් හා ඒකාබද්ධ ප්‍රවේශයක්

සහිතව කටයුතු කිරීම සහතික වනු පිණිස **ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුව** ස්ථාපනය කිරීම ජනාධිපති ලේකම් විසින් සිදු කරනු ඇත.

ජාතික වශයෙන් බලපෑම් ඇතිවිය හැකි විශේෂිත අවස්ථාවලදී හා දැඩි නියං හෝ ගංවතුර අවස්ථාවලදී එම ආපදාවන් සමනය කිරීමේදී ජල සම්පත් කමනාකරණය කළයුතු ආකාරය තීරණය කිරීමේදී ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුව, ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳ අමාත්‍ය කමිටුවේ උපදෙස් ලබා ගනු ඇත.

**8.2.2 කමිටුවේ සංයුතිය**

| | | |
|---|---|---|
| (1) | අග්‍රාමාත්‍ය ලේකම් | - සභාපති |
| (2) | වාරිමාර්ග විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් | - කමිටු ලේකම් හා කැඳවුම් කරු |
| (3) | කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් | - සාමාජික |
| (4) | ජල සම්පාදන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් | - සාමාජික |
| (5) | බල ශක්ති විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් | - සාමාජික |
| (6) | පරිසර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් | - සාමාජික |
| (7) | කර්මාන්ත විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් | - සාමාජික |
| (8) | ධීවර කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් | - සාමාජික |
| (9) | සංචාරක කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් | - සාමාජික |
| (10) | ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් | - සාමාජික |
| (11) | පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් | - සාමාජික |
| (12) | ජනාධිපති ලේකම් විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු | - සාමාජික |
| (13) | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය | - සාමාජික |

**8.2.3 ආරාධිත නියෝජිතයෝ**

**. ජාතික ජල සම්පත්** කළමනාකරණ කමිටුවට අමතර වශයෙන් අවශ්‍ය වියහැකි තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හෝ විෂයය විශේෂඥයින් අවශ්‍යතාව පරිදි කැඳවීමේ බලය කමිටු සභාපති සතු වන්නේ ය.

**8.2.4 උපදේශක මට්ටමේ නියෝජනය**

ජාතික ජල සම්පත් කමිටුවේ නිත්‍ය සාමාජිකයින් විසින් යම් කරුණක් පිළිබඳව විශේෂිත අධ්‍යනයන් අවශ්‍යයයි තීරණය කරනු ලබන අවස්ථාවල ජල විද්‍යා, පරිසර, ආර්ථික, නීති, භෞතික සැලසුම් වැනි ක්ෂේත්‍රයන්හි ඉහල සාක්ෂරතාවයක් සහිත වෘත්තිකයන් හෝ එම විෂයයන්ට අදාළ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් ගෙන් සමන්විත වන උපදේශක කමිටු, උපදේශන සේවා සඳහා යොදවා ගත හැකි වන්නේ ය.

**8.3. ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය (NWRS)**

**8.3.1. කාර්යභාරය**

ඒකාබද්ධ ප්‍රවේශයක් සහිතව ජාතික මට්ටමේ උපායමාර්ගික තීරණ ගැනීම සඳහා ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුව වෙත සහය වනු පිණිස වාරිමාර්ග විෂයභාර අමාත්‍යාංශය යටතේ අංශයක් ලෙස ස්ථාපනය කෙරෙන ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කරනු ඇත.

- ජල සම්පත් සම්බන්ධයෙන් වන ආයතනික ප්‍රවේශයන් ඒකාබද්ධ සහ සහභාගීත්ව ප්‍රවේශයක් සහිතව සිදු කිරීම සඳහා වන ජාතික මට්ටමේ මෙහෙයුම් හා අධීක්ෂණ යාන්ත්‍රණය ලෙස ක්‍රියාත්මක වීම.

- මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කෙටි, මධ්‍ය හා දිගු කාලීන උපායමාර්ගික සැලසුම් අදාළ ආයතන සමග සම්බන්ධීකරණයෙන් සකස් කිරීම.

- ජාතික මට්ටමින් ඒකාබද්ධ කළමනාකරණ ප්‍රවේශයක් සහිතව තීරණ ගැනීමට හා කාර්යයන් ඉටුකිරීමට ප්‍රමාණවත් පරිදි ජල සම්පත්වල පවතින තත්වය, එහි භාවිතයන්හි ස්වභාවය හා ජල දූෂණය ආදියට අදාළව විශ්ලේෂණය කරන ලද යාවත්කාලීන දත්ත හා තොරතුරු පවත්වා ගෙන යෑම.

- රාජ්‍ය ආයතන හා අනෙකුත් පාර්ශව වෙතින් ජල සම්පත් හා ජල දේහයන් භාවිතයට අදාළව යොමු වන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම හා ඒ පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.

- ජල සම්පත් හා ජල දේහයන් භාවිතයට අදාළව ඉල්ලීම් කළ නමුත් අදාළ ආයතනවල නිර්දේශය / අනුමැතිය හිමි නොවූ අවස්ථාවලදී එකී තාක්ෂණික තීරණ සාකලා ලෙස විශ්ලේෂණය කර, නැවත සුදුසු තීරණ ගැනීම සඳහා ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

- ජල පරිමාවන්, ජල දේහයන් හෝ ජල විභවයන් බෙදා ගැනීම හෝ වෙන් කර ගැනීමේ දී ගැටළු ඇති වුවහොත් අවස්ථානුකූලව මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කිරීම හෝ අවශ්‍යවන්නේ නම් ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුව වෙත තීරණ ගැනීම සඳහා ඉදිරිපත් කිරීම.

- යෝජිත ස්වාධීන අභියවනා කමිටු ක්‍රියාවලිය සඳහා අදාළ පහසුකම් සැලසීම හා වාර්තා තබාගැනීම.

- ජල සම්පත් ක්ෂේත්‍රය හා සම්බන්ධ විෂයයන්ට අදාළ ආංශික ප්‍රතිපත්ති සම්පාදනයේ දී මාර්ගෝපදේශයන් ලබා දීම.

- ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුවේ තීරණ දැනුම් දීම, එම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම, පසුවිපරම හා ඇගයීම.

- සමස්ථයක් ලෙස මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවීම සඳහා ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුව වෙත සහය වීම හා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ අනෙකුත් කාර්යයන් ඉටු කිරීම.

- ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම.

**8.3.2. සංයුතිය**

ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලයේ ප්‍රධානී වශයෙන් ජල සම්පත් සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ විෂය දැනුම හා අත්දැකීම්, සන්නිවේදන හැකියාවන් හා සාකච්ඡා සම්මුති හැකියාවන් සහිත ජ්‍යෙෂ්ඨ වෘත්තිකයකු අධ්‍යක්ෂ ජනරාල් ලෙස පූර්ණ කාලීනව පත් කරනු ලැබේ.

ජල සම්පත් අධ්‍යයනයන් හෝ කළමණාකරණය පිළිබඳ පරිචයක් හා හැකියාවක් ඇති හෝ අදාළ දත්ත පද්ධති නඩත්තු කරනු ලබන ප්‍රධාන පාර්ශවකාර ආයතන නියෝජනය කිරීම සඳහා එකී ආයතන ප්‍රධානීන් විසින් පූර්ණ කාලීනව සේවයෙන් නිදහස් කරනු ලබන තාක්ෂණික හෝ විශේෂඥ දැනුමැති අවම වශයෙන් එක් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු බැගින් ඔවුන්ගේ උසස් වීමේ හැකියාවන්ට බාධාවක් නොවන පරිදි ජාතික ජල සම්පත් ලේකම් කර්යාලයේ තාක්ෂණික සේවා අංශයට වෙනත් රාජකාරිමය වගකීම්වලින් නිදහස් කොට පූර්ණ කාලීන පදනමින් අනුයුක්ත කරනු ඇත.

ඉහත කාර්ය මණ්ඩලයට අතිරේකව අවශ්‍යතාවය පරිදි වෙනත් බහුවිධ ක්ෂේත්‍රයන්හි වෘත්තියවේදී ස්ථිර කාර්ය මණ්ඩලයක් සහ සහාය කාර්ය මණ්ඩලයක් පත් කරනු ඇත.

**09. අභියාවනා ක්‍රමවේදය.**

ශ්‍රී ලංකාවේ ජල සම්පත් හා බැඳුනු ඕනෑම කරුණකට අදාළව යම් ආයතනයක් මගින් හෝ ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය මගින් ලබා දෙන ඕනෑම නිර්දේශයක් හෝ ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුව මගින් ලබාදෙනු ලබන තීරණයක් සම්බන්ධයෙන්, අතෘප්තියට පත් පාර්ශවයක් හට එම කරුණ පිළිබඳ අභියාවනයක් යම් නිශ්චිත කාලයක් තුල ජ ාතික ජල සම්පත් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ හැක.

එසේ ඉදිරිපත් වන එක් එක් අභියාචනයක් හෝ නැවත සලකා බැලීමක් සඳහා සිදු කරන ඉල්ලීම් අදාළ ආයතනවල සහය ද ලබා ගනිමින්, අදාළ ගැටලු පිළිබඳ තාක්ෂණික හා සමාජ තත්වයන්, මෙන්ම එම ගැටලු විසඳීම සඳහා ඇති ලබා දිය හැකි විකල්ප යෝජනාද පරීක්ෂා කර තීරණයක් ලබා දීම පිණිස ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ.

ජාතික ජල සම්පත් කළමනාකරණ කමිටුව විසින් එසේ නැවත ලබා දෙනු ලබන තීරණයෙන් තව දුරටත් සෑහීමකට පත් නොවන පාර්ශවයන්ට ඒ පිළිබඳ නැවත සලකා බලා අවසාන තීරණයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය මගින් ජල සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳ අමාත්‍ය කමිටුව වෙත ඉදිරිපත් කළ හැකිය. එම අමාත්‍ය කමිටුව විසින් මේ පිළිබඳව නැවත සලකා බලා ලබා දෙනු ලබන තීරණය අවසාන තීරණය ලෙස සියලු පාර්ශවයන් විසින් පිළිගත යුතු වේ.

--o—

## පරිශිෂ්ටය

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී භාවිතා කළ යුතු, එහි අන්තර්ගතයෙහි සඳහන් පහත සඳහන් යෙදුම් සඳහා අදාළ වන සවිස්තරාත්මක නිර්වචන පහත පරිදි වේ.

**1. ප්‍රතිලාභීන්**

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ ප්‍රතිලාභීන් යනුවෙන් අදහස් කරනු ලබන්නේ සෘජුව හෝ වක්‍ර ලෙස ජල සම්පත පරිභෝජනය කරන්නන්, ජල සම්පත ආශ්‍රිතව ජීවනෝපාය සඳහා එම ජල මූලාශ්‍ර භාවිතා කරන්නන් හෝ වාණිජ පරමාර්ථ උදෙසා ජල මූලාශ්‍ර භාවිතා කරන්නන් වේ.

**2. පාර්ශවකරුවන්**

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ පාර්ශවකරුවන් යනුවෙන් අදහස් කරනුයේ ජල සම්පත් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, කළමනාකරණය, බෙදා හැරීම හා සංරක්ෂණය කිරීම සඳහා බලතල පැවරී ඇති හා ඒ අනුව ක්‍රියාත්මක වන අමාත්‍යාංශ, රාජ්‍ය දෙපාර්තමේන්තු, පළාත් සභා , පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා හා මණ්ඩල හෝ ඉහත කාර්යයන් සඳහා බලය පවරා ඇති වෙනත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන වේ.

**3. මුල් භාවිතයන්**

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ මුල් භාවිතයන් යනුවෙන් අදහස් කරනුයේ දැනටමත් රජය මගින් විවිධ අවශ්‍යතා සඳහා සංවර්ධනය කර ඇති ජල සම්පත් ව්‍යාපෘති, සැලසුම් කිරීමේදී හා භාවිතයේදී අපේක්ෂිත වූ හා මේ දක්වා භුක්ති විඳිමින් පවතින මූලික ප්‍රතිලාභයන් වේ.

**4. ගංදැලේ භුක්තිකරුවන්**

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ ගං දැලේ භුක්තිකරුවන් යනුවෙන් අදහස් කරනුයේ ගංගා, ඇළ දොළ හා ස්වභාවික ජලාශ ඉවුරේ පදිංචිය සහිත ඉඩම් හිමි අයවලුන්ට ගෘහස්ථ අවශ්‍යතා ගෘහාශ්‍රිත සතුන්ට, ගවයින්ට හා වගාවන් සඳහා ජලය සැපයීම සඳහා රජයේ ඉඩම් ආඥාපනත යටතේ ප්‍රතිපාදන සලසා ඇති සීමාවන්ට යටත්ව එම ජල මූලාශ්‍ර භාවිතා කිරීමට ඉඩ සලසා ඇති අයවලුන් වේ.

**5. ජලය හා බැඳුණු සම්ප්‍රදායන්**

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ ජලය හා බැඳුණු සම්ප්‍රදායන් යනුවෙන් අදහස් කෙරෙනුයේ ජාතික, ආගමික හා සංස්කෘතික උත්සව සඳහා අවශ්‍ය වන සහ පාරම්පරිකව ජන සමාජය තුළ සම්මත වූ ජල භාවිතාවන් වේ.

**6. ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය**

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය යනුවෙන් අදහස් කෙරෙනුයේ එක් එක් අංශවල ජල අවශ්‍යතා, එනම් කෘෂිකාර්මික , ගෘහස්ථ, කර්මාන්ත, සංචාරක මෙන්ම ඉදිරි කාලයන්හිදී හඳුනා ගැනෙන වෙනත් ක්ෂේත්‍ර සියල්ල සමස්ථයක් ලෙස සලකා බලමින් එක් එක් ජල මූලාශ්‍ර වල හෝ ඒකාබද්ධ කළ මූලාශ්‍රවල සම්පත් ඒ ඒ අංශ සඳහා අපේක්ෂිත ප්‍රතිලාභ, ආපදා කළමනාකරණය, පාරිසරික අවශ්‍යතා ආදී සියලු අංශ සැලකිල්ලට ගනිමින් හා අදාළ සියලු අංශ වල සහභාගිත්වය ලබා ගනිමින් දිගු කාලීන, මධ්‍ය කාලීන මෙන්ම කෙටි කාලීන සැලසුම් සකස් කිරීම, එම සැලසුම්වලට අනුගතව එක් එක් අංශ සඳහා අවශ්‍ය සංවර්ධනයන් ඉටු කිරීමට කටයුතු යෙදීම, මෙන්ම එම සැලසුම් අනුව සිදු කෙරෙන කළමනාකරණ කටයුතු නියාමනය කිරීම වේ.

**7. විවිධාංගීකරණය වන ආංශික ජල අවශ්‍යතා**

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ **විවිධාංගීකරණය වන ආංශික ජල අවශ්‍යතා** යනුවෙන් අදහස් කෙරෙනුයේ එක් එක් අංශවල ජල අවශ්‍යතා (එනම් කෘෂිකාර්මික , ගෘහස්ථ, කර්මාන්ත, සංචාරක මෙන්ම ඉදිරි කාලයන්හිදී හඳුනා ගැනෙන ක්ෂේත්‍ර ආදී) වේ. එම අවශ්‍යතා සමාජ ආර්ථික ඉල්ලුම් මත කාලීනව වෙනස් වන සුළුය.

EOG 03 - 0186

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.